THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP
Funded by
The European Union



# පේර

## අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට වගා කරමු.

HIGH DENSITY DOUBLE ROW

05

# අස්වනු පුරෝකථනය හා නෙළීම

## CROP FORECASTING AND HARVESTING

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය

# 5. අස්වනු පුරෝකථනය හා නෙළීම

5.1 ආවරණ යෙදීම

5.2 ආවරණ යෙදීමේදි සැළකිය යුතු කරුණු

5.3 පේර කවර යෙදීම කළමනාකරණය

5.4 පලතුරු ඉන්වෙන්ටරි කළමනාකරණය

5.5 අස්වනු නෙළීම





# පේර
## අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට වගා කරමු

**පේර** වගා කරන ප්‍රදේශය තුළ මාස දෙකකට පෙර එක සතියෙන් සතියට ලබා ගත හැකි අස්වනු ප්‍රමාණය කල් තියා දැන ගත හැකි ක්‍රමයක් ලෙස පලතුරු තොග කළමනාකරණය (Fruit desk management) හඳුනා ගත හැකිය.

කල් තියා අවශ්‍ය ඇනවුම් ලබා ගැනීම, අස්වනු සැකසීමට අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය තීරණය කිරීම, අවශ්‍ය ඇසුරුම් ප්‍රමාණ තීරණය කිරීම ආදිය කල් තියා සැළසුම් කිරීමේ හැකියාව පලතුරු තොග කළමනාකරණය තුළින් හැකියාව ලැබේ.



## 5.1 ආවරණ යෙදීම

### අරමුණු

- පලතුරු මැස්සන්, යුෂ උරාබොන කෘමීන් වැනි පළිබෝධකයින්ගෙන් හා ඇන්ත්‍රැක්නෝස් වැනි දිලීර රෝග වලින් ආරක්‍ෂා කර ගැනීමට
- පලතුරුවලට ආකර්ශනීය පෙනුමක් ලබා දීමට
- යාන්ත්‍රික හානි අවම කිරීම

- පලතුරු අස්වැන්න නිර්ණය කිරීම පලතුරු සතිය මත පදනම්ව (එක් පලතුරු සතියක් සඳහා එක් වර්ණයක් යොදා ගනි.
- අලෙවි සැළසුම් කටයුතු (සුපිරි වෙළඳසැල් ජාලය සඳහා ඉදිරිපත් කිරීම සැළසුම්ආදිය අස්වනු නෙළීමට පෙර) කළ හැකිය

පේර සඳහා යොදන ආවරණය
දිග සෙ.මී 25 හා පළල සෙ.මී 19.8ක් වේ.

## ඇයි වර්ණ කවර...

දුර සිටම වයස තීරණය කළ හැක

අස්වැන්න නෙළන විට අදාල සතියේ ආවරණයද සමඟ අස්වැන්න නෙළා අස්වනු සකසන ස්ථානයට ගෙන ආ යුතුය

එය සමාගමට අස්වැන්න නෙළීමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට හැකි වේ.

පරිසරයට හානියක් නොවන සේ කවර ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය.



## 5.2 සැළකිය යුතු කරුණු

**මල් පිපී දින 30කදි පමණ (දෙහි ගෙඩියක් ප්‍රමාණයේදි) කවර දැමීම කළ යුතුය.**

- ආවරණ යෙදීමේ දී නියමිත හැඩය නැති පේර ගෙඩි ඉවත් කරන්න.
- නිරෝගි, රෝග හා පළිබෝධ නොමැති පලතුරුවලට පමණක් කවර යොදන්න.
- කවරයේ කර/කට මනාව ඇසිරෙන ලෙස හොඳින් සීල් කරන්න.
- හිරු එළිය ඇති විටදී කවර යෙදීම වඩාත් සුදුසුය.
- වයස තීරණය කිරීම සඳහා එක් එක් සතියට අදාල වර්ණය යෙදිය යුතුය.
- එක සතියක එක වර්ණයක් ලෙස මෙය සිදු කෙරේ (සති 07කට වර්ණ 07කි)
- බොහෝවිට එක අත්තක පේර ගෙඩි 03ක් පමණ හට ගන්නා අතර ඉන් වඩාත් හොඳ එක් ගෙඩියක් සඳහා පමණක් ආවරණ යොදන අතර ඉතිරි ගෙඩි ඉවත් කළ යුතුය.



## වර්ණ මත පදනම්ව ආවරණ කිරීම

- සමාගමේ කළමනාකාරීත්වයක් විසින් සකසනු ලබන වාර්ෂික වාර්ථා සටහනක් මේ සඳහා යොදා ගැනේ.
- ඉරිදා ආරම්භ වන සතිය සෙනසුරාදාවෙන් අවසන් වන සේ එක් සතියක් ගණනය කරයි. ඒ සතියේ ප්‍රදේශයේ සියළු ගොවිපලවල් එකම වර්ණයේ බෑගයක් මඟින් පේර ගෙඩි ආවරණය කරයි.



- කවර යොදා සති 6, 7, 8 දී අස්වැන්න නෙළා ගත හැක.

**ආවරණ යෙදීම මඟින් පලතුරේ නිශ්චිත වයස තීරණය කළ හැකිය.**

පේර ආවරණ යෙදීම මඟින්, වයස අනුව හා පලතුරු පරිණත වීම මත අස්වනු නෙළීම සිදුකළ හැකිය.

| Week | W/I | W/E | Colour | Tag | Bag |
|---|---|---|---|---|---|
| 46 | 12-Nov | 18-Nov | Brown | BR | |
| 47 | 19-Nov | 25-Nov | Red | R | |
| 48 | 26-Nov | 2-Dec | Purple | P | |
| 49 | 3-Dec | 9-Dec | Yellow | Y | |
| 50 | 10-Dec | 16-Dec | Green | G | |
| 51 | 17-Dec | 23-Dec | Blue | BL | |
| 52 | 24-Dec | 30-Dec | Orange | O | |



## 5.3 පේර කවර යෙදීම කළමනාකරණය

- සෑම දිනකම උදයේ වරුවේ දි කවර යොදන සේවකයන්ට ගණන් කරන ලද බෑග් සංඛ්‍යාවක් ලබා දීම

- වැඩ නිමවන විට ඉතිරි කවර ප්‍රමාණය අධීක්ෂණ නිලධාරියාට භාර දිය යුතුය.

- දිනයේ ලබා දුන් කවර ප්‍රමාණය සහ ආපසු ලබා ගත් කවර ප්‍රමාණයේ වෙනසින් ඒ දිනයේ යෙදූ කවර ප්‍රමාණය දැන ගත හැක.

- සේවකයන් සංඛ්‍යාව යෙදූ කවර ප්‍රමාණය, දිනයේ අවසානයේ සටහන් කර ගත යුතුය. මේ ආකාරයට ඒ සතියේ යෙදූ කවර ප්‍රමාණ එකතු කළ විට සතියේ කවර ප්‍රමාණය ලබා ගත හැක. එම ප්‍රමාණ තවත් සති 7කට පසු නෙළන අස්වනු ප්‍රමාණයයි.

## 5.4 පලතුරු ඉන්වෙන්ටරි කළමනාකරණය



**ගොවිපල දිනය ආරම්භයේ දි සතියේ වර්ණයට අනුව බෑග් ගණනය කර ගොවීන්ට ලබා දිය යුතුය. මෙහිදී පෙර සතියේ ඉතිරි වූ බෑග් නැවත භාර ගත යුතුය.**

- මෙහිදී කළමනාකරුට ගත වූ සතියේ භාවිතා කළ බෑග් ප්‍රමාණය නිවැරදිව ගණනය කර ගත හැකිය.
- මේ තොරතුරු ඉන්වෙන්ටරි ගත කළ යුතුය.
- සියළුම පලතුරු අස්වැන්න නෙළන තෙක් මේ තොග පොතේ (ඉන්වෙන්ටරි) තබා ගත යුතුය.
- ඉන්වෙන්ටරි අනුව ඒ ඒ සතියේ නෙළා ගත හැකි අස්වනු ප්‍රමාණය ගැන දැන ගැනීමට මේ මඟින් පහසුවෙන් හැකියාව ලැබේ.

- එසේම අලෙවිකරණ හා විකුණුම් උපාය මාර්ග සැළසුම් කිරීමට ද මේ ඉන්වෙන්ටරි ගත තොරතුරු ඉතා වැදගත් වේ.

## 5.5 අස්වනු නෙළීම

**ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව, වෙළඳපල මිල අනුව සහ මේරීම අනුව අස්වැන්න නෙළා ගැනීම තීරණය වේ. වර්ණ හතකින් යුත් බෑග් මත පදනම්ව අස්වැන්න නෙළනු ලැබේ. සති 6, 7, 8 දක්වා වයස් වල අස්වැන්න නෙළා ගැනීමට හැකියාව ඇත.**

**මෙහිදී,**

- සති 6 - 8 පලතුරු පරීක්ෂා කර බලා පරිණත වූ හා ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව අස්වනු ලෙස නෙළා ගනු ලැබේ.
- සති 8 වූ පලතුරු පරීක්ෂා කර නොබලා සියල්ල නෙළා ගත යුතුය.
- අස්වනු නෙළිය යුත්තේ ප්ලාස්ටික් පෙට්ටිවලට (Plastick crates) වන අතර පලතුරු තනි තට්ටුවක් ලෙස ඇසිරිය යුතුය.
- අස්වනු නෙළීම, අතින් හෝ බෑගයකට සවි කල පිහියක් ආධාරයෙන් සිදු කළ හැකිය.



- ඉතා ප්‍රවේශමෙන් අස්වැන්න හැසිර විය යුතු අතර ගෙඩි විසි කිරීම, අත හැරීම වැනි දෑ නොකළ යුතුය.
- අස්වනු නෙළූ පසු දැඩි හිරු එළියට නිරාවරණ නොවන සේ සෙවණෙහි තැබිය යුතුය.

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට වගා කරමු.

## ප්‍රකාශන කට්ටලය

1. බිම් සකස් කිරීම
2. ක්ෂේත්‍ර සන්ස්ථාපනය හා අතුරු බෝග වගාව
3. කප්පාදුව හා පුහුණුව
4. ක්ෂේත්‍ර සනීපාරක්ෂාව හා රෝග පළිබෝධ
5. අස්වනු පුරෝකථනය, නෙළීම හා සැකසීම

05




# අස්වනු පූරෝකථනය හා නෙළීම

CROP FORECASTING AND HARVESTING